# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2464/02 - 2025 නොවැම්බර් මස 24 වැනි සඳුදා - 2025.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: VE/DS/AQ/WS/192.
*අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2017/WS/192.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මණ්කුම්පාන් ජේ/ 11 ග්‍රාම නිලධාරී වසමේ මණ්කුම්පාන් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 910358 හි හෙක්ටයාර් 1.8670 ක් පමණ වූ ඉඩම් කැබලිවල විස්තර පහත පරිදි වේ.

ඉඩම් අත්කර ගැනීමට හේතුව - යාපනය - කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ අල්ලෙපිට්ටි ජල තුළුමං නව ළිං නිර්මාණය කිරීම සඳහා වූ ඉඩම් සහ පොම්පාගාරය පැරණි තුළුමං ළිං හා ජල කුළුණ යනාදිය ඉදි කර තිබෙන ඉඩම් අත්කර ගැනීම සඳහා.

01. කැබලි අංකය :- **01**
ඉඩමේ නම: කමානි තෝඩ්ඩම් වෙඩ්ඩික්කාඩු; විස්තරය: වත්ත; හිමිකම් කියන්නාගේ නම: කන්දසාමි සිවනේස්වරන් මහතාගේ බිරිඳ පත්මලෝසනි; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.5289.

| | | |
|---|---|---|
| උතුර | - | : ඉඩමේ නම නොදනී, වත්තේ, හිමිකරු නොදන්නා සහ ඕඩය |
| නැගෙනහිර | - | : ඕඩය සහ ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා |
| දකුණ | - | : ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා සහ පාර (ප්‍රාදේශීය සභා) |
| බටහිර | - | : පාර (ප්‍රාදේශීය සභා) සහ ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා |

02. කැබලි අංකය :- **02**
ඉඩමේ නම: නොදනී; විස්තරය: ස්ථිර ගොඩනැගිලි 08ක් සහ ජල ටැංකිය සහිත වත්ත; හිමිකම් කියන්නන්ගේ නම: නොදනී; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 1.3381.

| | | |
|---|---|---|
| උතුර | - | : ඉඩමේ නම නොදනී, වත්තේ, හිමිකරු නොදන්නා සහ පාර (ප්‍රාදේශීය සභා) |
| නැගෙනහිර | - | : පාර (ප්‍රාදේශීය සභා) සහ ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා |
| දකුණ | - | : ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා |
| බටහිර | - | : ඉඩමේ නම නොදනී, වත්තේ හිමිකරු නොදන්නා |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ

**2026 ජනවාරි මස 26 වැනි දින පෙ. ව. 10.00** ට දිවයින් දකුණ, වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, **2026 ජනවාරි මස 12** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ටී. අකිලන්,**
ප්‍රාදේශීය ලේකම්,
දිවයින දකුණ, වේලනෙයි.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
දිවයින දකුණ, වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.